00106

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන **2017/2018**

අවසාන පරීක්ෂණය

**ESC1135/EPC1335** -නිර්මාණාත්මක හා සෞන්දර්ය අධ්‍යාපනය හා හසුරු කුසලතා සංවර්ධනය

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2019.04.23 වේලාව - ප.ව.02.00 - ප.ව.04.00 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## <u>1 වන කොටස</u>

01. පෙරපාසල් දරුවන්ගේ හසුරු කුසලතා සංවර්ධනයේ පරමාර්ථ හතරක් (04) දක්වන්න.

02. පෙරපාසල් දරුවන්ගේ සියුම් චාලක හැකියා සංවර්ධනය කළ හැකි ක්‍රියාකාරකම් හතරක් (04) දක්වන්න.

03. කුඩා දරුවන්ගේ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා භාවිත කළහැකි විවිධ ස්වභාවික ද්‍රව්‍ය පහක් (05) ලයිස්තුගත කරන්න.

04. කුඩා දරුවන්ගේ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා භාවිත කළහැකි ඉවතලන ද්‍රව්‍ය පහක් (05) ලයිස්තුගත කරන්න.

05. චිත්‍ර හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා කුඩා දරුවන් පෙළඹවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් (04) දක්වන්න.

06. ළමා නාට්‍ය සඳහා වෙස් මුහුණු භාවිත කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

07. පෙරපාසල් දරුවන්ගේ දළ චාලක හැකියා සංවර්ධනය සඳහා සුදුසු ක්‍රියාකාරකම් පහක් (05) නම් කරන්න.

08. පෙර පාසල් දරුවන්ගේ දළ චාලක හැකියා සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී පෙරපාසල් ගුරුවරුන් විසින් සැළකිලිමත් විය යුතු කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) සංගීතය හා චලන ක්‍රියාකාරකම් පෙර පාසල දරුවන්ගේ කායික, චිත්තවේග හා සමාජ සංවර්ධනයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) පෙර පාසල් දරුවන්ගේ සමස්ත සංවර්ධනය කෙරෙහි ළමා නාට්‍ය බලපාන ආකාරය උදාහරණ සහිතව විශ්ලේෂණය කරන්න. (ලකුණු 12)

10. (i) පෙරපාසල් තුළ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් සඳහා භාවිත කළ හැකි උපකරණ පහක් **(05)** ලයිස්තුගත කරන්න. (ලකුණු 08)

(ii) පෙරපාසල් දරුවන් සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී ගුරුවරියක විසින් සැලකිලිමත් විය යුතු කරුණු හතරක් **(04)** පැහැදිලි කරන්න.

(ලකුණු 12)

11. (i) පෙරපාසල් දරුවන්ගේ චිත්‍ර ඇඳීමේ හැකියා සංවර්ධනය සඳහා පෙරපාසල් ගුරුවරියට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් හතරක් **(04)** දක්වන්න.

(ලකුණු 08)

(ii) ළමා චිත්‍ර ඇගයීමේදී ගුරුවරිය සැලකිලිමත් විය යුතු කරුණු හතරක් **(04)** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

12. (i) එක් එක් ළමා චිත්‍ර සංවර්ධන අවධි ආශ්‍රිත සුවිශේෂ ලක්ෂණ විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

(ii) "ළමා චිත්‍ර තුලින් ළමයින්ගේ චිත්තවේගී තත්ත්වයන් ප්‍රදර්ශනය කළ හැකිය."

ඔබ මෙයට එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 12)

13. (i) පෙරපාසල් දරුවන්ට උචිත නිර්මාණාත්මක ඉගෙනුම් පරිසරයක් පවත්වාගෙන යාම සඳහා පෙර පාසල් ගුරුවරියට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් හතරක් **(04)** යෝජනා කරන්න. (ලකුණු 08)

(ii) නිර්මාණාත්මක පෙර පාසල් පරිසරයක් පවත්වාගෙන යාමේදී ඔබට මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු තුනක් **(03)** දක්වන්න. (ලකුණු 03)

(iii) ඒවා විසඳීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 09)

හිමිකම් ඇවිරිණි.